## 1.4. විකල්ප හා පර්යේෂණාත්මක නාට්‍ය ප්‍රවේශයන්

**(මෙම අංශය යටතේ විවිධ විකල්ප හා පර්යේෂණාත්මක රංග ප්‍රවේශයන් වර්ෂයකට එකක් බැගින් භාවිතයට ගැනේ)**

### 1.4.1 **ජ්‍යෙෂ්ඨ අංශය: අවකාශ විශේෂී රංගය** (Site Specific Theatre)

- ගැහැණු/පිරිමි වශයෙන් වර්ග කිරීමක් නැත.
- කාලය උපරිම විනාඩි 30ත් 45ත් අතර විය යුතු ය.
- නිර්මාණයේ සියලුම අංග ස්වතන්ත්‍ර විය යුතු ය.
- සාම්ප්‍රදායික පින්තූර රාමු වේදිකාවක් හෝ එළිමහන් රංග භූමියක් භාවිතයන් ඔබ්බට ගොස් සාම්ප්‍රදායික නොවන අවකාශයක රංගය ඉදිරිපත් කිරීම අවකාශ විශේෂී (Site Specific) රංගයේ දී අපේක්ෂා කෙරේ. එකම අවකාශයක තෝරාගත් පරිශ්‍ර කිහිපයක වුව ද රංගය සැලසුම් කරගත හැකිය. නිදසුනකට, අතහැර දැමූ ගොඩනැගිල්ලක්, වී ගබඩාවක්, ක්‍රීඩාගාරයක්, කාර්යාල පරිශ්‍රයක්, ගොවිපෙළක්, කර්මාන්ත ශාලාවක් යනාදිය මෙම රංගය ඉදිරිපත් කිරීමට යොදාගත හැකි අවකාශ ලෙස සඳහන් කළ හැකි ය.
- මේ සඳහා අයදුම් කරන පාසල්, තම නිර්මාණයට භාවිත කිරීමට තෝරාගත් අවකාශය (Site) පිළිබඳ තොරතුරු, ඡායාරූප, නාට්‍ය පිටපත සහ පරිශ්‍රයේ සුවිශේෂතාවන් සහ රංග කාර්යය නිර්මාණාත්මකව සංකලනය කිරීම පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් සමස්ත රංග සැලැස්ම ව්‍යාපෘති වාර්තාවක් ලෙසින් ඉදිරිපත් කළ යුතු ය.
- සුවිශේෂිත ශීර්ෂයක් බැවින් මෙහි පළාත් වටයක් හෝ පළාත් පාදක ඇගයීමක් නොමැති අතර රංග ව්‍යාපෘති යෝජනාව සමාලෝචනයෙන් ඇගයීම් මණ්ඩලය තෝරා දෙනු ලබන හොඳම නිර්මාණ උපරිම 11ක් (එක් පළාතකට එකක් බැගින් සහ ජූරියේ නිර්දේශ මත තෝරාගන්නා දෙකක් වශයෙන්) ජාතික වටයක් ලෙස ඇගයීමට ලක් කෙරේ.
- නිර්මාණාත්මක වශයෙන් ඉහළ ප්‍රමිතියකින් තොර බවට ඇගැයීම් මණ්ඩලය නිර්ණය කරන නිර්මාණ මෙම තේරීම් වටයේදීම ඉවත් කෙරේ.
- මෙම ව්‍යාපෘති වාර්තා ඇගැයීමෙන් තෝරාගන්නා පාසල් තම නිර්මාණය අදාල ක්ෂේත්‍රයේ රංගගත කළ යුතු අතර අමාත්‍යාංශයීය ඇගැයීම් මණ්ඩලය එම ක්ෂේත්‍රයට පැමිණ එය ඇගැයීමට ලක් කරනු ලැබේ. මෙම රංගගත කිරීම පාසලට අවශ්‍ය නම් මහජන දර්ශනයක් ලෙස වුව ද පැවැත්වීම වඩාත් යෝග්‍ය වනු ඇත.
- රංගනයට සහභාගි විය හැකි සංඛ්‍යාව නිර්මාණයට උචිත පරිදි තීරණය කළ හැකිය.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.

## 1.5. ඒක-පාත්‍ර නාට්‍ය (Monodrama)

**එක් පාත්‍රයෙක් පමණක් සිටින නාට්‍යයකි.**

### 1.5.1 **ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය: ඒකල**

- ගැහැණු/පිරිමි වශයෙන් වර්ග කිරීමක් නැත.
- ස්වතන්ත්‍ර නිර්මාණයක් විය යුතු අතර චරිතය ඉස්මතු විය යුතු ය.
- ශබ්ද හා සංගීත සංයෝජනයන් මෙන්ම අනෙකුත් ආනුෂංගික අංග භාවිතයට ද අවස්ථාව ඇත.
- උපරිම කාලය විනාඩි 10 කි. අවම කාලය විනාඩි 05කි.
- නිර්මාණ සංඛ්‍යාව උපරිම 11ක් නොඉක්මවන තෙක් පළාත් ප්‍රථම ස්ථානවලට අතිරේකව ජූරියේ නිර්දේශිත හොඳම නිර්මාණ ජාතික වටයට තෝරා ගැනේ

# 2 කාණ්ඩය – නිර්දේශිත නාට්‍ය ජවනිකා

## 2.1 නූතන දෙස්/විදෙස් නාට්‍යකරුවන්ගේ නාට්‍ය ආශ්‍රිත නාට්‍යමය අවස්ථා නිරූපණය

**නම් කරන ලද දේශීය / විදේශීය නාට්‍යකරුවන්ගේ නාට්‍ය ඇසුරෙන් තෝරාගත් නාට්‍යමය කොටස් නිරූපණය කිරීමකි. (මෙම අංශයේ දී එක් වර්ෂයක දී යෝජිත දේශීය කරුවන්ගේ නිර්මාණ යොදා ගැනෙන්නේ නම් අනෙක් වර්ෂයේ දී භාවිත වන්නේ යෝජිත විදේශීය නාට්‍යකරුවන්ගේ නිර්මාණ ය)**

### 2.1.1 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය: 2021 වර්ෂයට යෝජිත විදේශීය නාට්‍යකරුවා – හෙන්රික් ඉබ්සන්

- හෙන්රික් ඉබ්සන්ගේ වන තාරාවි (The Wild Duck), සයුරෙන් ආ ළඳ (The Lady From the Sea) සහ සමාජයේ බල කණු (The Pillars of Society) යන නාට්‍ය තුනෙන් එකකින් තෝරාගත් කොටසක් විය යුතු ය.

## 2.2 ග්‍රීක-රෝම හා ශේක්ෂ්පියරියානු නාට්‍ය ආශ්‍රිත නාට්‍යමය අවස්ථා නිරූපණය

**(මෙම අංශයේ දී එක් වර්ෂයක දී ග්‍රීක – රෝම ප්‍රහසන භාවිත කෙරෙන්නේ නම් ඊ ළඟ වසරේ දී භාවිත වන්නේ ග්‍රීක – රෝම ඛේදජනක නාට්‍ය වේ. ශේක්ෂ්පියරියානු නාට්‍ය ශීර්ෂයේ දී විලියම් ශේක්ෂ්පියර්ගේ ඛේදජනක, සුඛ ජනක හා ඓතිහාසික (Histories) නාට්‍ය වර්ෂයකට එකක් බැගින් භාවිතයට ගැනේ)**

### 2.2.1 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය: ග්‍රීක හා රෝම ඛේදාන්ත නාට්‍ය

- නිර්දේශිත ග්‍රීක ඛේදාන්ත නාට්‍යයකින් තෝරා ගත් කොටසක් නිරූපණය කිරීම මෙම වසර සඳහා අපේක්ෂා කෙරේ.
- ග්‍රීක නාට්‍යකරු යුරිපිඩීස්ගේ මීඩියා, හිපොලිටස් හා ඇල්කීස්ටිස් යන නාට්‍ය තුනෙන් එකකින් තෝරාගත් කොටසක් විය යුතු ය.
- දැනට සිංහල පරිවර්තනයන් වශයෙන් නිකුත් වී ඇති නාට්‍ය කෘතීන් මෙන් ම, මේ වෙනුවෙන් ම සිදු කරන පරිවර්තනයන් ද පාදක කොට ගත හැකි ය.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.

### 2.2.2 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය: ශේක්ෂ්පියර් නාට්‍ය

- විලියම් ශේක්ෂ්පියර්ගේ ඛේදජනක (Tragedy) නාට්‍ය ගණයේ රෝමියෝ ජුලියට් නාට්‍යයෙන් තෝරා ගත් කොටසක් නිරූපණය කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.
- පටිගත කළ සංගීතය සහ ශබ්ද සංයෝජනයන් භාවිතයට ද බාධාවක් නොමැත.
- නාට්‍යමය අවස්ථාවන් නිර්මාණය කිරීමේ දී, මෙම චක්‍රලේඛයෙහි අංක 7.2 හා 7.3 වගන්තිවල සඳහන් කරුණු පිළිබඳව විශේෂයෙන් සැලකිළිමත් විය යුතු ය.

## 2.3 සංස්කෘත හා සරච්චන්ද්‍ර නාට්‍ය ආශ්‍රිත නාට්‍යමය අවස්ථා නිරූපණය

**මෙම අංශයේ දී එක් වර්ෂයක දී සංස්කෘත නාට්‍ය යොදා ගැනනේනේ නම් අනෙක් වර්ෂයේ දී භාවිත වන්නේ එදිරිවිර සරච්චන්ද්‍ර නාට්‍යකරුවාගේ නිර්මාණ වේ**

### 2.3.1 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය: සරච්චන්ද්‍ර නාට්‍ය

- මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ එලොව ගිහින් මෙලොව ආවා නාට්‍යයෙන් තෝරාගත් ජවනිකාවක් විය යුතු ය.
- සංගීත භාවිතය මුල් කෘතියට අනුකූලව සිදු කළ යුතු වේ.
- මෙම නිර්මාණ කිසිදු විද්‍යුත් මාධ්‍යයකින් ප්‍රචාරය නො කළ යුතු ය.

**ඉහත ශීර්ෂ අංක 2.1.1, 2.2.1, 2.2.2, 2.3.1 සඳහා පොදු කොන්දේසි**

- 10 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන්ට පමණක් සීමා විය යුතුය
- කාලය උපරිම විනාඩි 15ක් විය යුතුය.
- අදාළ නාට්‍ය පෙළට අනුව රංගනයට සහභාගී විය හැකි සංඛ්‍යාව තීරණය කර ගත හැකි ය.
- තෝරාගත් නාට්‍ය කොටස, මුල් පිටපතට අනුකූල විය යුතු අතර කවර අයුරකින්වත් නාට්‍ය පෙළ වෙනස් කිරීමක් හෝ විකෘති කිරීමක් සිදු නො කළ යුතුය.
- ආනුෂංගික අංග නාට්‍යයේ මුල් කෘතියට හානි නො වන සේ භාවිත විය යුතු ය.

# 3 කාණ්ඩය – ඒකල රංගන, භූමිකා රංගන සහ කතාන්දර කථනය

## 3.1 කතාන්දර කථනය

**දෙස් විදෙස් ජන කතාවක්, සුරංගනා කතාවක්, උපමා කතාවක් හෝ වෙනත් සුදුසු සමකාලීන කතාවක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම අපේක්ෂිත ය.**

**3.1.1 ප්‍රාථමික අංශය ඒකල – විවෘත -**

- මෙම අංශය සඳහා සහභාගී වීමට සුදුසුකම් ලැබීමට නාට්‍ය නිෂ්පාදන ශීර්ෂයකට ඉදිරිපත් වීමේ අනිවාර්යතාවයෙන් සිසු සංඛ්‍යාව 500ට අඩු පාසල් නිදහස් කෙරේ.
- කාලය විනාඩි උපරිම විනාඩි 05ක් විය යුතු ය.

**3.1.2 කනිෂ්ඨ ද්විතියික අංශය සමූහ – විවෘත -**

- මෙම අංශය සඳහා සහභාගී වීමට සුදුසුකම් ලැබීමට නාට්‍ය නිෂ්පාදන ශීර්ෂයකට ඉදිරිපත් වීමේ අනිවාර්යතාවයෙන් සිසු සංඛ්‍යාව 500ට අඩු පාසල් නිදහස් කෙරේ.
- සහභාගි විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි.
- කාලය විනාඩි උපරිම විනාඩි 05ක් විය යුතු ය.

**3.1.3 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය - සමූහ – විවෘත (10-11 ශ්‍රේණි)**

- කාලය විනාඩි 03ත් 05ත් අතර විය යුතුය.

**3.1.4 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය - ඒකල - ගැහැනු (10-13 ශ්‍රේණි)**

- කාලය විනාඩි 03ත් 05ත් අතර විය යුතුය.

**3.1.5 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය - ඒකල - පිරිමි (10-13 ශ්‍රේණි)**

- කාලය විනාඩි 03ත් 05ත් අතර විය යුතුය.

**ඉහත 3.1.1, 3.1.2, 3.1.3, 3.1.4, සහ 3.1.5 යන ශීර්ෂ සඳහා පොදු කොන්දේසි**

- දෙස් විදෙස් ජන කතාවක්, සුරංගනා කතාවක්, උපමා කතාවක් හෝ දරුවන්ගේ වයස් මට්ටමට ගැලපෙන වෙනත් සුදුසු සමකාලීන කතාවක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කළ යුතු ය.
- රංග භාණ්ඩ, රංග වස්ත්‍ර ආදිය භාවිත කිරීමට ඉඩ ඇති අතර ස්ථානීය වශයෙන් සපයා ගත හැකි මේසයක් පුටුවක් වැනි සරල සහ අත්‍යවශ්‍ය ම පසුතල පමණක් භාවිත කළ හැක.
- ඉදිරිපත් කරන්නාට පමණක් හැසිරවිය හැකි ආකාරයේ සංගීත/ශබ්ද සංයෝජනයන්ට වුව ද ඉඩ ඇත.
- රූකඩ වුව ද භාවිත කිරීමට නිදහස තිබේ.

## 3.2 භූමිකා රංගන / ගැමි නාටක චරිත නිරූපණ / අභිරූපණ

**වාචික අභිනය කේන්ද්‍රීයව රංගන හැකියාව ඇගයීම මෙහි මූලික අරමුණ වන මෙම කාණ්ඩයේ ඒකල භූමිකා රංගන සඳහා පහත නිර්දේශිත භාෂන කොටසක් ඉදිරිපත් කිරීම අපේක්ෂිතය. ගැමි නාටක චරිත නිරූපණ අංශයේ දී ශ්‍රී ලංකාවේ දේශීය ශාන්තිකර්ම ආශ්‍රිත නාට්‍යමය පෙළපාලියක් හෝ අන්තර් රංග අවස්ථාවක් හෝ සොකරි හා කෝලම් නාට්‍ය නිර්මාණ ආශ්‍රිත අවස්ථාවක් ආශ්‍රිත නිරූපණයක් අපේක්ෂිත ය. අභිරූපණයේ දී අවස්ථාවක් හෝ සිද්ධියක් ප්‍රකාශ වන සේ වාචික අභිනයෙන් තොර ව කෙරෙන නිර්මාණාත්මක ප්‍රකාශන රංගනයක් අපේක්ෂා කෙරේ.**

**3.2.1 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය; ඒකල භාෂණය - ගැහැනු (12-13 ශ්‍රේණි)**

**3.2.2 ජ්‍යෙෂ්ඨ ද්විතියික අංශය; ඒකල භාෂණය - පිරිමි (12-13 ශ්‍රේණි)**

